# ළමා ජනගහනයේදී සිංහල ජනගහනය පමණක් අඩුවෙලා - පා.ම. උදය ගම්මන්පිල

**චාමර සම්පත්**

ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයට සාපේක්ෂව ළමා ජනගහනයේදී සිංහල ජනගහනය පමණක් අඩුවී ඇති අතර, ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ සහ මුස්ලිම් ජනවර්ගවල වර්ධනය වැඩි වී ඇතැයි පිවිතුරු හෙළ උරුමයේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී උදය ගම්මන්පිල මහතා පැවසීය.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව ලබාගත් 2012 ජන සංගණනයේ තොරතුරු අනුව මෙම කරුණ නිල වශයෙන්ම ඔප්පු කර පෙන්විය හැකි බවද ඊයේ (19දා) පැවැති මාධ්‍ය හමුවකදී මන්ත්‍රීවරයා ප්‍රකාශ කළේය.

රජයේ නිල ලේඛන ඇසුරින් මෙම කරුණ ඔප්පු කළ හැකි බවත්, මේ සම්බන්ධයෙන් ජාතියේ අවධානය යොමුවිය යුතු බවත් පැවසූ ඒ මහතා,

"2012 ජන සංගණනයට අනුව සමස්ත ජනගහනයෙන් 75%ක් සිංහල, 11%ක් ලංකා දෙමළ, 04%ක් ඉන්දියානු දෙමළ සහ 09%ක් මුස්ලිම් ජනගහනය නියෝජනය වෙනවා. ඒ වසරේදීම ළමා ජනගහනය පිළිබඳ අවධානය යොමු කිරීමේදී 71%ක් සිංහල, 12%ක් ලංකා දෙමළ, 05%ක් ඉන්දියානු දෙමළ සහ 12%ක් මුස්ලිම් ජනගහන නියෝජනය වෙනවා.

ඒ අනුව සමස්ත ජනගහනයට සාපේක්ෂව ළමා ජනගහනයේදී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ, මුස්ලිම් ජනවර්ගවල ප්‍රතිශතය වැඩි වුණත් සිංහල පමණක් අඩුවෙලා තිබෙනවා.

සමස්ත ජනගහනයේ සිංහල ප්‍රතිශතය 75%ක් වනවිට ළමා ජනගහනය 71%ක් දක්වා 04%න් අඩුවී තිබෙනවා. මුස්ලිම් ජනගහනය 09% සිට 12%ක් දක්වා ශීඝ්‍ර වර්ධනයක් සිදුව තිබෙනවා. අවුරුදු 5 - 9 වයස් කාණ්ඩයට සාපේක්ෂව අවුරුදු 0-4 කාණ්ඩයේදී සිංහල ජනගහනයේ වර්ධනය 0.5%ක් පමණයි. එම සීමාව තුළ මුස්ලිම් ජනගහනයේ වර්ධනය 1.4%ක්. ඒ කියන්නේ සිංහල ජනගහනය වගේ තුන්ගුණයකින් මුස්ලිම් ජනගහනය වර්ධනය වෙමින් තිබෙනවා. 2012 තත්ත්වයක් මේ විදිහට තිබෙන්නේ. වර්තමාන තත්ත්වය හොයන්න වෙන්නේ ඊළඟ ජන සංගණනයෙන් පසුවයි.



මෑත කාලයේදී මුස්ලිම් ජනවර්ගය ශීඝ්‍රයෙන් වර්ධනය වෙනවා කියන එක අපට දක්නට ලැබෙන තත්ත්වයක්. 1953දී 06%ක් වූ මුස්ලිම් ජනගහනය ඊට අවුරුදු 28ට පසුව 07% දක්වා පමණයි වර්ධනය වී තිබුණේ. නමුත් ඊටත් වසර 30 පසුව 09% දක්වා වර්ධනය වී තිබෙනවා. තවත් අවුරුදු 10කින් ළමා ජනගහනය පෙන්වන වර්ධනය අනුව මෙය 12% ඉක්මවා යන බව පෙනී යනවා. නිදහසින් පසුව ප්‍රථම වතාවට සිංහල ජනවර්ගය අඩු වෙමින් පවතින බව වාර්තා වෙන්නෙ 2012දීයි. ඒ අනුව සිංහල ජාතිය වඳවෙමින් පවතින ජාතියක් බවට පත්වෙමින් තිබෙන බව අනාවරණය වී තිබෙනවා. මේ සම්බන්ධයෙන් ජාතියේ අවධානය යොමුවිය යුතුයි" යැයි පැවසීය.